# ගොවිකටයුතු පුවත් හසුන

වෙළුම 47 -2023 ජනවාරි-මාර්තු කලාපය
ISSN 1991-040x

## HARTI වසර 51ක් සපුරයි...

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ 51වන සංවත්සරය පෙබරවාරි 21 දින ඉතාමත් චාම් අයුරින් ආයතනයේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි ආචාර්ය පී.ජී. බන්දුල මහතාගේ ප්‍රධානත්වයෙන් සහ සමස්ත සේවක මණ්ඩලයේ සහභාගිත්වයෙන් ආයතන පරිශ්‍රයේදී සමරන ලදී.**

**මෙම උත්සවයේ ප්‍රධාන දේශනය ශ්‍රී ලංකා සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රෝහණ පී. මහලියනආරච්චි මහතා විසින් සිදු කරන ලද අතර ආයතනයේ අධි පර්යේෂක ආනන්ද සමරකෝන් මහතා විසින් ද ආයතනයේ ආරම්භය, විකාශනය සහ වර්තමාන අභියෝග සම්බන්ධයෙන් විශේෂ දේශනයක් පවත්වන ලදී.**

**එමෙන්ම ආයතනයේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි, අතිරේක අධ්‍යක්ෂ (ආචාර්ය එන්.පී.ජී. සමන්ත මහතා) සහ ලේඛකාධිකාරී (බී.ආර්.සී. බණ්ඩාර මහතා) විසින් ද පැමිණ සිටි පිරිස අමතා කෙටි දෙසුම් පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා ආයතනයේ සේවක මණ්ඩලය ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.**



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

HARTI



## 2023 වසරේ ආයතනයේ රාජකාරි ආරම්භය සනිටුහන් කරමින් ....

2023 නව වසරේ රාජකාරි අරඹන පළමු දිනය සනිටුහන් කරමින් ජනවාරි 02 දින අප ආයතනයේ උත්සවයක් පැවැත්වුණි. අනතුරුව මහා සංඝ රත්නය සෙත් පිරිත් සජ්ඣායනා කොට ආයතනයට, ආයතනයේ සේවක මණ්ඩලයට සහ සමස්ත රට වැසි ජනතාවට සෙත් පතා ආශිර්වාද එක් කළහ.

මෙම අවස්ථාවට ආයතනයේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි ආචාර්ය ජී.ජී. බන්දුල මහතා ප්‍රමුඛ සමස්ත සේවක මණ්ඩලය සහභාගී වූහ.

## ගොවිමිණට Dev Pro ආයතනයේ අනුග්‍රහය

2021 වර්ෂයේ සිට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ‘ගොවිමිණ’ කෘෂිකාර්මික ජාතික පුවත්පතේ සමස්ත මුද්‍රණ හා බෙදාහැරීමේ වියදම් සඳහා ඩෙව් ප්‍රෝ (DEV Pro) ආයතනය අනුග්‍රහය දක්වා තිබේ.




2023 පෙබරවාරි කලාපයේ සිට 2023 ජූනි කලාපය දක්වා මාස 5ක කාලයක් ගොවිමිණ පුවත්පත සහ ඊට සමගාමීව දමිළ භාෂාවෙන් පළ කරන ගොවිමිණ සඟරාව මුද්‍රණය හා බෙදා හැරීම සඳහා ද රුපියල් ලක්ෂ 43ක මූල්‍ය ප්‍රතිපාදනයක් එම ආයතනය විසින් ලබා දී තිබේ.

## ගොවිජන වනසත්ත්ව ගැටලුව පිළිබඳ වාර්තාව ඇමතිතුමා අතට

කෘෂිකර්ම අමාත්‍යාංශය සහ HARTI ඒකාබද්ධව සකස් කරන ලද 'ගොවිජන-වනසත්ත්ව ගැටලුව සම්බන්ධ යෝජනා, නිර්දේශ සහ ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාව කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතා වෙත පසුගියදා (මාර්තු 29) පිළිගැන්වුණි.



කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟින් එක්ව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සංවිධානය කළ ගොවිජන වනසත්ත්ව ගැටලුව පිළිබඳ 2022.12.29 දින පැවති විද්වත් සාකච්ඡාවේදී ඉදිරිපත් වූ අදහස් සම්පිණ්ඩනය කර ජොෂ්ඨ මහාචාර්ය බුද්ධි මාරඹේ ප්‍රමුඛ කමිටුව විසින් සකස් කළ වාර්තාව එලෙස පිළිගැන්වුණි.

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක්.....





පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එම්.ඩී ලමාවංස සහ අප ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ජී.ජී. බන්දුල යන මහත්වරු අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති මහාචාර්ය සරත් කොඩිතුවක්කු සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ (වැඩ ආවරණ) ආචාර්ය එන්.පී.ජී සමන්ත යන මහත්වරු ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

ශ්‍රී ලංකාව පුරා පිහිටි විශ්වවිද්‍යාලවල කෘෂිකර්ම පීඨ සමඟ එක්ව පර්යේෂණ හා පුහුණු දැනුම හුවමාරු කර ගැනීමේ අරමුණින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් අවබෝධතා ගිවිසුම්වලට එළැඹීම අඛණ්ඩව සිදු කළ අතර මෙහි එක් අදියරක් ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ ද ගිවිසුමකට එළඹීම සිදු විය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර පර්යේෂණ හා පුහුණු අවස්ථා පුළුල් කිරීමේ අරමුණින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම ජනවාරි 10 වෙනිදා සිදු විය. ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා දෙපාර්ශවය සතු දැනුම, සීමාවාසික අවස්ථා, අධ්‍යාපන වැඩසටහන් සහ පර්යේෂණ හා පුහුණු අවස්ථා වඩාත් පුළුල් සහ ඵලදායී ලෙස සහයෝගීතාවයෙන් යුතුව යොදා ගැනීම මෙහි අපේක්ෂාවයි.

# ගොවියා, ගොවිතැන සහ ආහාර සුරක්ෂිතතාවය
# වාර්ෂික පර්යේෂණ සංවාද මණ්ඩපය - 2023

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ වාර්ෂික පර්යේෂණ සංවාද මණ්ඩපය මාර්තු මස 29 ආයතනයේ මහින්ද සිල්වා ශ්‍රවණාගාරයේ දී ඉතාමත් සාර්ථක ආකාරයෙන් අවසන් විය.



පසුගිය වසර තුළ ආයතනය විසින් සිදුකරන ලද කාලීනව වැදගත් පර්යේෂණ අධ්‍යයනයන්හි සොයාගැනීම් පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සෙසු පාර්ශවකරුවන් දැනුම්වත් කිරීම සහ මෙම වසර තුළ සිදුකරනු ලබන පර්යේෂණ, පුහුණු සහ තොරතුරු සන්නිවේදන කටයුතු පිළිබඳව විවිධ පාර්ශවයන්ගෙන් අදහස් හා යෝජනා ලබාගැනීම මෙම වැඩසටහනෙහි ප්‍රධානතම අරමුණ විය.



රාජ්‍ය අමාත්‍යාංශ අතිරේක ලේකම්වරුන්, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතන ප්‍රධානින්, කෘෂිකර්ම පියාධිපතිවරුන් හා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින්, පුද්ගලික අංශයේ ව්‍යවසායකයින්, ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරුන් ඇතුළු විවිධ පාර්ශව නියෝජනය කරමින් විශාල පිරිසක් මෙම විද්වත් සභාව සඳහා තම ක්‍රියාකාරී සහභාගිත්වය ලබාදුන්හ. මෙම අවස්ථාවට ගරු කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූ අතර කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය මොහාන් පී ද සිල්වා මහතා, ගරු පශුසම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ඩී.බී. හේරත් සහ කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් ගුණදාස සමරසිංහ යන මහත්වරු ද විශේෂ ආරාධිතයින් ලෙස සහභාගී වූහ.

# ගෘහ ඒකකයන්හි ආහාර සුරක්ෂිතතාවය පවත්වාගෙනයාම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන - මුලතිවු සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක



වර්තමාන ආර්ථික අභියෝගයන් හමුවේ අප රටේ ජනතාව ආහාර සුරක්ෂිතතාවය පවත්වාගැනීම සම්බන්ධයෙන් අභියෝග රැසකට මුහුණ දෙමින් සිටිති. මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා රජය විසින් ගෙන යන වැඩපිළිවෙලට සමගාමීව සහ ඒ සඳහා සහාය දීමක් ලෙස ගෘහ ඒකකයන්හි ආහාර සුරක්ෂිතතාවය පවත්වාගෙන යාම සඳහා අනුගමනය කළහැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ග්‍රාමීය සහ අර්ධ නාගරික ප්‍රදේශයන්හි ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමේ ආයතනය විසින් දියත් කර ඇත. මෙම වැඩසටහන් තුළින් ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රය වර්තමානයේ මුහුණ දෙන අභියෝග ජය ගැනීම සඳහා ක්‍රියාත්මක වීම, ගෙවත්ත ආශ්‍රිතව බෝග හා සත්ත්ව නිෂ්පාදන තුළින් ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම, ගෘහ මට්ටමින් සිදුවන ආහාර නාස්තිය අවම කිරීම සහ ආහාර සංරක්ෂණ ක්‍රම අනුගමනය කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම, පෝෂණය සුරැකෙන සෞඛ්‍ය සම්පන්න ආහාර පරිභෝජන රටාවකට හුරුවීම තුළින් ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම යන තේමාවන් ඔස්සේ සහභාගි වූවන් දැනුවත් කිරීම අරමුණ විය.

**2023** වර්ෂය සඳහා මෙම වැඩසටහන් හි ආරම්භක වැඩසටහන් මාලාව **2023** මාර්තු මස **20** සිට **30** දක්වා වූ සති දෙකක කාලය තුළ දී මුලතිවු සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය කරමින් සාර්ථකව පවත්වා අවසන් කරන ලදී. අදාළ ප්‍රදේශයන්හි මව්-හවුල කණ්ඩායම් සහ ගෙවතු වගා වැඩසටහන් සඳහා පිහිටුවා ඇති ගොවි කණ්ඩායම් හි නියෝජිතයින් මෙම වැඩසටහනේ ඉලක්ක පුහුණුලාභීන් වූ අතර මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩපත්තුව, වැලිඔය, පුදුකුඩුඉරිප්පු, ඔඩ්ඩුසුඩාන්, මාන්තෙයි - නැගෙනහිර, තුනුක්කායි සහ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි, කණ්ඩාවලෙයි, පූනරීන් සහ පලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යලයන්හි දී පවත්වන ලද වැඩසටහන් හරහා ප්‍රතිලාභීන් **420** දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් දැනුවත් කරන ලදී. මෙම වැඩසටහන් සඳහා කුඩා කණ්ඩායම් හි නියෝජිතයින් පුහුණුලාභීන් ලෙස සම්බන්ධ කරගැනීමෙන් මෙම පණිවිඩය වඩා වැඩි පිරිසකට සම්ප්‍රේශණය කිරීමට හැකිවෙනු ඇතැයි විශ්වාස කෙරේ. මෙම වැඩසටහන් සඳහා සම්පත්දායක ත්වය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යාපන සහ පුහුණු අංශය, උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාලයන් සහ එම දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සෞඛ්‍ය අධ්‍යාපන සහ ප්‍රවර්ධන අංශය මගින් සපයා ගැණින. මෙම වැඩසටහන් සම්බන්ධිකරණය සහ මෙහෙයවීම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මඟින් සිදු කෙරුණු අතර ප්‍රාදේශීය සංවිධාන කටයුතු අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ අදාල ප්‍රදේශයන්හි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරනු ලැබිණ. වැඩසටහන සඳහා භාෂා පරිවර්තන කටයුතු සහ දමිළ මාධ්‍යයෙන් සම්බන්ධීකරණ කටයුතු සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සිසුන්ගේ සහාය ලබා ගැණින.

## ජාතික කෘෂිකර්ම ව්‍යාප්ති පද්ධතියේ ධාරිතා වර්ධනය පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් සංවිධානය කරනු ලැබූ ජාතික කෘෂිකර්ම ව්‍යාප්ති පද්ධතියේ ධාරිතා වර්ධනය පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන පසුගිය ජනවාරි 11 සහ 12 යන දෙදින යාපනය තිරුනෙල්වේලි හි පිහිටි දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේදී සාර්ථකව පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහනෙහි පුහුණුලාභීන් ලෙස උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ වන යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කහි සියලුම ක්ෂේත්‍ර නිලධාරිහු සහභාගී වූහ. තවද උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වවුනියාව, මුලතිවු සහ මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි ක්ෂේත්‍ර නිලධාරින් සඳහා වූ වැඩසටහන කිලිනොච්චි දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේදී ජනවාරි මස 27 සහ 28 යන දෙදින පවත්වන ලදී. යාපනය විශ්ව විද්‍යාලයීය කෘෂිකර්ම පීඨයේ කථිකාචාර්යවරු මෙම පුහුණු වැඩසටහන් ද්විත්වය සඳහා සම්පත් දායකත්වය දැක්වූහ.

ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුයුක්ත මොනරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි ක්ෂේත්‍ර නිලධාරින් සහභාගී වූ දෙදින පුහුණු වැඩසටහන 2023 මාර්තු මස 02 සහ 03 යන දිනයන්හි බණ්ඩාරවෙල බිදුණුවැව සේවා සංස්කරණ ආයතනයේ දී පැවැත්වූ අතර ඒ සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයේ කථිකාචාර්යවරු සම්පත්දායකත්වය සැපයූහ.

කෘෂිකර්ම අමාත්‍යංශයේ මගපෙන්වීම මත එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ මූල්‍ය සහයෝගිතාවය ඇතිව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය එක්ව මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. ජ්‍යෝෂ්ඨ පර්යේෂණ නිලධාරි ශාන්ත හේවගේ මහතා විසින් සම්බන්ධීකරණය කරනු ලැබූ මෙම පුහුණු වැඩසටහන් මාලාව මෙහෙයවීම ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි සිදත් බණ්ඩාර මහතා සහ පර්යේෂණ නිලධාරි චින්තක ජයසූරිය මහතා විසින් සිදුකරන ලදී.

# මාසික ප්‍රසිද්ධ දේශන මාලා







## HARTI යූටියුබ් වීඩියෝ මාලාව



සුභ සාධක සංගමය විසින් සංවිධානය කරනු ලැබූ වාර්ෂික ක්‍රිකට් තරගාවලියේ...



ජීවිතය ජයගත් දිරිය කාන්තාව/Courage



වන සත්ත්ව හානි - "මොකක්ද මේකට තියන පිළියම" / Wild animal attacks ...



ජීවනෝපාය සාර්ථක කරගැනීමට උපදෙස් / Tips to make a successful...



මල් වලින් සල්ලි හොයන හැටි / How to make money with flowers -...



බිම්මල් වවමු - සල්ලි හොයමු / mushroom cultivation



ගෙවත්තෙන් ජීවිතය ජයගන්නේ මෙහෙමයි / How to win life through home...



ගොවියාටත් පාරිභෝගිකයාටත් උපරිම ලාභයක් ලබන්න මේ විදියට කරන්න

# ගොවිකටයුතු පුවත් හසුන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මඟින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ගොවිකටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා ක්‍රියාකාරී වැඩටසහන්වල දී ලබා ගන්නා පර්යේෂණ තොරතුරු මෙමඟින් ප්‍රකාශයට පත් කෙරේ. ලබා ගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකිය.

*උපදේශකත්වය*
ආචාර්ය ජී.ජී. බන්දුල
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

*අධීක්ෂණය*
ඩබ්.එච්.ඒ. ශාන්ත
අංශ ප්‍රධාන
තොරතුරු හා සන්නිවේදන අංශය

*සම්පාදනය*
වසන්ති රාජපක්ෂ
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී

*නිර්මාණය හා පිටු සැකසුම*
උදේනි කරුණාරත්න

*ගොවිකටයුතු පුවත්හසුන ප්‍රකාශනය*
*මුද්‍රණය හා බෙදා හැරීම*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය


දුරකථනය - 0112696981
ෆැක්ස් - 0112692423
වෙබ් - www.harti.gov.lk
ෆේස්බුක් https://www.facebook.com/hartilk


## HARTI ප්‍රකාශන






















